# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/7/5/6/1 | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2017.12. 08 |

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) **16-2017**

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා පැරණි අංක : 82/83 හා M/F කාණ්ඩ යටතේ ලියාපදිංචි පැරණි සාමාජිකයින් මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/2017 හා 2017.10.12 දිනැති ලිපිය හා බැඳේ. ( එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

02. එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/6/8/3 හා 2017/11/29 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත

03. මේ වන විට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සියළුම කාර්යයන් පරිගණක ගත කරමින් විධිමත් හා සරල කිරීම සිදු කරන අතර ,සියලු රාජ්‍ය නිලධාරීන් විශ්‍රාම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මාර්ග ගත ක්‍රමවේදය භාවිතා කරමින් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබයි.

04.මෙම පහසුකම් තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා දැනට වැන්දඹු ,වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වූ රාජ්‍ය නිලධාරීන් ජාතික හැඳුනුම්පත් අංකය (නව/පැරණි) හා දැනට ඔවුන් වෙත නිකුත් කර ඇති වැන්දඹු ,වැන්දඹු පුරුෂ හා අනත්දරු අංකය ඇතුලත් කරමින් මාර්ගගත ක්‍රමය (Online) යටතේ නැවත ලියාපදිංචි කිරීමට තීරණය කර ඇති අතර දැනටමත් මාර්ග ගත ක්‍රමයට (Online) ලියාපදිංචි වී ඇති සාමාජිකයින්ට තම තොරතුරු යථාවත් (UPDATE) කිරීමට පහසුකම් සලසා ඇත.

05. එබැවින් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි නොවූ සියළුම රාජ්‍ය නිලධාරීන් 2018.03.31 දිනට පෙර නැවත ලියාපදිංචිය අනිවාර්ය වන අතර, ඒ සඳහා www.pensions.gov.lk යන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් නැවත ලියාපදිංචි පිවිසුම් වෙත පිවිස එහි සඳහන් උපදෙස් පරිදි වැන්දඹු ,වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි නැවත ලියාපදිංචි විය යුතු බවට දන්වා ඇත.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office: 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"

මෙම චක්‍රලේඛ උපදෙස් පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්: 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),දකුණු පළාත : අ.ක.ස.
03. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ ,දකුණු පළාත : දැ.ගැ.ස.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 26/2017

මගේ අංකය: Pns/P8/02/16
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ
අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2017.10.12

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා පැරණි අංක: 82/83 හා M/F කාණ්ඩ යටතේ ලියාපදිංචි පැරණි සාමාජිකයින් මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම**

1898 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත හා 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත අනුව සියලුම රාජ්‍ය සේවකයින් අනිවාර්යයෙන්ම වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ දායක වීම අත්‍යාවශ්‍ය කරුණක් වේ. මේ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ මඟින් ලබා දී ඇති උපදෙස්වලට ද අවධානය යොමු කරවමි.

02. ඒ අනුව දැනටමත් පොදු 86, පොදු 86(අ) අයදුම්පත් භාවිත කරමින් සියලුම රාජ්‍ය සේවකයින්ට 82/83 හා F/M කාණ්ඩ යටතේ සාමාජික අංක නිකුත් කර තිබේ.

03. එසේම වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයට දායක වන නව නිලධාරීන් සඳහා 2015.03.12 දින සිට මාර්ගගත ක්‍රමය (Online) හඳුන්වා දී PD 01 අයදුම්පත මඟින් ලියාපදිංචි කර අංක කාණ්ඩයන් නිකුත් කර ඇත.

04. මේ වන විට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සියලුම කාර්යයන් පරිගණක ගත කරමින් විධිමත් හා සරල කිරීම සිදු කරනු ලබන අතර, සියලු රාජ්‍ය නිලධාරීන් විශ්‍රාම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මාර්ගගත ක්‍රමවේදය භාවිත කරමින් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබයි.

05. එය ඉතා කාර්යක්ෂම හා ඵලදායී වැඩසටහනක් බව හඳුනාගෙන ඇති අතර, එමඟින් නිලධාරීන්ගේ තොරතුරු යාවත්කාලීන වීම හේතුවෙන් නැවත නැවත තොරතුරු ගෙන්වා ගැනීම අවශ්‍ය නොවේ. මෙම පහසුකම් තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා ඉහත 02 ඡේදයේ දක්වා ඇති පරිදි දැනට වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වූ සියලු රාජ්‍ය නිලධාරීන් ජාතික හැඳුනුම්පත් අංකය (නව/පැරණි) හා දැනට ඔබ වෙත නිකුත් කර ඇති වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අංකය ඇතුළත් කරමින් මාර්ගගත ක්‍රමය (Online) යටතේ නැවත ලියාපදිංචි කිරීමට තීරණය කර ඇත.

06. මෙම චක්‍රලේඛයෙහි 03 ඡේදයේ පරිදි දැනටමත් මාර්ගගත ක්‍රමයට (Online) ලියාපදිංචි වී ඇති සාමාජිකයින්ට තම තොරතුරු යථාවත් (Update) කිරීමට පහසුකම් සළසා ඇත.

එබැවින් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි නොවූ සියලුම රාජ්‍ය නිලධාරීන් 2018.03.31 දිනට පෙර නැවත ලියාපදිංචිය අනිවාර්ය වන අතර, ඒ සඳහා **www.pensions.gov.lk** යන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් නැවත ලියාපදිංචි පිවිසුම වෙත පිවිස එහි සඳහන් උපදෙස් පරිදි වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි නැවත ලියාපදිංචි විය යුතු බව දන්වමි.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය